ඔබ මේවන විට හින්දුස්ථානි සංගීතය හා සම්බන්ධව රාග 7 ක් දැනුවත් වී ඇත. ඒවා නම් බිලාවල් , භූපාලි , යමන් , ඛමාජ් , කාෆි , භීම්පලාශ්‍රී හා භෛරවී යන රාගයන්ය.

රාගයක් නිර්මාණය වී ඇත්තේ ස්වර ඇසුරු කරමිනි. එක් එක් රාග නිරීක්ෂණය කිරීමේ දී එම රාග වල යෙදෙන ස්වර එකිනෙකට වෙනස් වන බව හඳුනාගෙන ඇත. ඒ සඳහා අපට උපකාරී වන්නේ රාගයේ ආරෝහණය හා අවරෝහණය වේ. මේ අනුව ඔබට නියමිත රාගවල විශේෂතා හඳුනා ගෙන ඇත්දැයි නිරීක්ෂණය කරන්න. ඔබ උගත් ලක්ෂණ ගීත ද මේ සඳහා උපයෝගී කර ගත හැකිය.

| රාගය | ආරෝහණ/අවරෝහණය | විශේෂතා |
|---|---|---|
| බිලාවල් | ස රි ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | ස්වර 7 ම ශුද්ධ වේ. |
| භූපාලි | ස රි ග ප ධ ස්<br>ස් ධ ප ග රි ස | ආරෝහණයේ අවරෝහණයේ ම නි වර්ජ්‍ය වේ. |
| යමන් | ස රි ග ම/ ප ධ නි ස්<br>ස් නි ධ ප ම/ ග රි ස | තීව්‍ර ම යෙදේ. |
| ඛමාජ් | ස ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | ආරෝහණයේ රි වර්ජ්‍ය වේ. අවරෝහණයේදී පමණක් නි කෝමළ වේ. ශුද්ධ හා කෝමළ නි යෙදෙන බැවින් ද්වි නිෂාද යෙදේ. |
| කාෆි | ස රි ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | ස්වර 7 ම යෙදේ. ග නි ස්වර කෝමළ වේ. |
| භීම්පලාශ්‍රී | නි. ස ග ම ප නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | ආරෝහණයේ රි ධ වර්ජ්‍ය වේ. ග නි ස්වර කෝමළ වේ. |
| භෛරවී | ස රි ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | රි ග ධ නි යන ස්වර කෝමළ වේ. ස්වර 7 ම යෙදේ. |

රාග හඳුනා ගනිමු

| රාගය | ආරෝහණ/අවරෝහණය | මේලය | වාදි ස්වරය | සංවාදි ස්වරය | ජාතිය | ගාන සමය | මුඛ්‍යාංගය | විශේෂතා |
|---|---|---|---|---|---|---|---|---|
| බිලාවල් | ස රි ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | බිලාවල් | ධ | ග | සම්පූර්ණ | දිවා ප්‍රථම ප්‍රහරය | ග රි , ග ප ධ නි ස් | ස්වර 7 ම ශුද්ධව යෙදේ. |
| භූපාලි | ස රි ග ප ධ ස්<br>ස් ධ ප ග රි ස | කල්‍යාන | ග | ධ | ඖඩව | රාත්‍රී ප්‍රථම ප්‍රහරය | ග රි ස ධ ,<br>ස රි ග ප ග ,<br>ධ ප , ග රි ස | ආරෝහණයේ හා අවරෝහණයේදී මධ්‍යමය හා නිෂාදය නොයෙදේ.<br>(ම , නි ස්වර වර්ජ්‍ය වේ.) |
| යමන් | ස රි ග ම් ප ධ නි ස්<br>ස් නි ධ ප ම් ග රි ස | කල්‍යාන | ග | නි | සම්පූර්ණ | රාත්‍රී ප්‍රථම ප්‍රහරය | නි රි ග රි ස ,<br>ප ම/ ග රි ස | ස්වර 7 ම යෙදෙන අතර මධ්‍යමය තීව්‍ර වේ.<br>(ම/ යෙදේ) |
| ඛමාජ් | ස ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | ඛමාජ් | ග | නි | ෂාඩව සම්පූර්ණ | රාත්‍රී දෙවන ප්‍රහරය | නි ධ , ම ප ධ , ම ග | ආරෝහණයේ දී රි වර්ජ්‍ය වේ. ආරෝහණයේදී නි ස්වරය ශුද්ධව යෙදේ. අවරෝහණයේදී නි කෝමළව යෙදේ. (නි යෙදේ) ද්වි නිෂාදයන් යෙදේ. |
| කාෆී | ස රි ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | කාෆී | ප | ස | සම්පූර්ණ | රාත්‍රී දෙවන ප්‍රහරය | ස ස , රි රි ,<br>ග ග ,ම ම , ප | ස්වර 7 ම යෙදේ. ග නි ස්වර කෝමළ වේ.<br>(ගාන්ධාරය , නිෂාදය කෝමළ වේ) |
| භීම්පලාශ්‍රී | නි ස ග ම ප නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | කාෆී | ම | ස | ඖඩව සම්පූර්ණ | රාත්‍රී තෙවන ප්‍රහරය | නි ස ම , ප ම ග ,<br>ම ග රි ස | ආරෝහණයේදී රි ධ යන ස්වර වර්ජිත වේ. ග නි ස්වර කෝමළ වේ. (ගන්ධාරය හා මධ්‍යමය කෝමළ වේ.) |
| භෛරවී | ස රි ග ම ප ධ නි ස්<br>ස් නි ධ ප ම ග රි ස | භෛරවී | ම | ස | සම්පූර්ණ | දිවා ප්‍රථම ප්‍රහරය | ම ග , ස රි ස ,<br>ධ නි ස | ස්වර 7 ම යෙදේ. රි ග ධ නි ස්වර කෝමළ වේ. |

**නිර්දේශිත සියළුම රාගයන්හි රාග විස්තර**